මගේ අංකය : MOJ/E18/නුවරඑළිය/රක්වාන/විවිධ

අධිකරණ අමාත්‍යාංශය

2022 අප්‍රේල් මස 04 දින

<u>**අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති සංචාරක නිවාස වෙන් කිරිම සඳහා වූ නියමයන්**</u>

සංචාරක නිවාසයන්හි නවාතැන් ගනු ලබන නිලධාරින් විසින් පහත සඳහන් කරුණු පිළිපැදිය යුතු බව කාරුණිකව දන්වමි.

**නුවරඑළිය සංචාරක නිවාස වෙන් කළ හැකි නිලධාරින්**

1. සියලුම විනිසුරුවරුන්
2. අධිකරණ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය
3. අධිකරණයන්හි රෙජිස්ට්‍රාර්වරු සහ ගණකාධිකාරිවරුන්
4. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන වල මාණ්ඩලික නිලධාරින්
5. ගරු අධිකරණ අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලය

**රක්වාන සංචාරක නිවාස වෙන් කළ හැකි නිලධාරින්**

1. අධිකරණ අමාත්‍යාංශයෙහි මාණ්ඩලික නිලධාරින් සහ කාර්ය මණ්ඩලය
2. සියලුම රජයේ ආයතනවල කාර්ය මණ්ඩලය

**වෙන් කරගත හැකි ආකාරය**

1. ඒ සඳහා සකස් කර ඇති අයදුම්පත මඟින් ඉල්ලිම යොමු කිරිම අනිවාර්ය වේ.අයදුම්පත්‍රය අධිකරණ අමාත්‍යාංශය වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය.( www.moj.gov.lk)
2. අයදුම්පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිතව අධිකරණ අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය
3. අයදුම්පත්‍රය සමඟ නියමිත ගාස්තු ගෙවා ලබාගන්නා ලද ලදුපත ඉදිරිපත් කළ යුතුය. නියමිත ගාස්තු අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් නමින් මජන බැංකුවේ අංක 176100199025184 ගිණුමෙහි තැන්පත් කර ලදුපතක් ලබාගත යුතුය.
4. අයදුම්පත්‍රයෙන් ඉල්ලා ඇති තොරතුරු සියල්ලම සම්පූර්ණ කළ යුතු අතර අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
5. ප්‍රමාණවත් කල් වේලා ඇතිව වෙන් කර ගැනීම සිදුකර ගත යුතුය.

මේ සම්බන්ධව 2017.08.09 දිනැතිව නිකුත් කර ඇති අධිකරණ අමාත්‍යාංශයිය චක්‍රලේඛ අංක 2/2017 මෙම නියමයන් ක්‍රියාත්මක වන දින සිට අවලංගු වේ.

**ගාස්තු සහ නවාතැන් ගත හැකි පුද්ගලයින් සංඛ්‍යාව**

| | කාමර සංඛ්‍යාව | නවාතැන් ගත හැකි උපරිම සංඛ්‍යාව | එක් කාමරයකට දිනකට අය කරන ගාස්තුව |
|---|---|---|---|
| නුවර එළිය සංචාරක නිවාසය (VIP) | ඉහළ මාලය<br><br>කාමර අංක 01<br>කාමර අංක 02<br>කාමර අංක 03 | <br><br>02<br>03<br>03 | රු.750 |
| නුවරඑළිය සංචාරක නිවාසය (සාමාන්‍ය) | පහල මාලය<br><br>කාමර අංක 01<br>කාමර අංක 02 | <br><br>04<br>02 | රු.650 |
| | රාජකාරි ගමන් සඳහා අධිකරණ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය | | ගාස්තු අය නොකෙරේ. |
| | රියදුරු කාමරය | 01 | ගාස්තු අය නොකෙරේ. |

| සංචාරක නිවාසය | කාමර සංඛ්‍යාව | නවාතැන් ගත හැකි උපරිම සංඛ්‍යාව | එක් කාමරයකට දිනකට අය කරන ගාස්තුව | |
|---|---|---|---|---|
| | | | අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සඳහා | බාහිර ආයතන කාර්ය මණ්ඩල සඳහා |
| රක්වාන සංචාරක නිවාසය (VIP) | ඉහල මාලය<br><br>කාමර අංක 01 | <br><br>03 | රු.750 | |
| රක්වාන සංචාරක නිවාසය (සාමාන්‍ය) | ඉහළ මහල<br><br>කාමර අංක 02<br>කාමර අංක 03<br><br>පහල මාලය<br><br>කාමර අංක 01<br>කාමර අංක 02 | <br><br>03<br>03<br><br><br><br>03<br>03 | රු.650 | රු.850 |
| | රාජකාරි ගමන් සඳහා අධිකරණ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය | | ගාස්තු අය නොකෙරේ | |
| | රියදුරු කාමරය | 01 | ගාස්තු අය නොකෙරේ | |

***VIP කොටසට අයත් කාමර වෙන් කර ගත හැක්කේ විධායක ශ්‍රේණිවලට අයත් කාර්ය මණ්ඩලයට පමණි.**

**කොන්දේසි :**

1. අයදුම්කරු අනිවාර්යෙන් සංචාරක බංගලාවේ නවාතැන් ගැනිම සිදුකළ යුතු අතර නවාතැන් ගැනිමේදි **රාජකාරි හැඳුනුම්පත, අමාත්‍යාංශය මඟින් වෙන් කිරිම අනුමත කරන ලද අයදුම්පතෙහි පිටපත** බංගලා භාරකරු වෙත අනිවාර්යෙන් ඉදිරිපත් කළ යුතුය.

   (සැ.යු - අයදුම්කරු නොමැතිව නවාතැන් ගැනිම සඳහා පැමිණෙන පිරිස ආපසු හරවා යැවිමට සිදුවන බව කරුණාවෙන් සලකන්න.)
2. මෙම අමාත්‍යාංශයේ රාජකාරි අවශ්‍යතාවයක දි කෙටි දැනුම් දීමකින් මෙම වෙන්කිරිම අවලංගු කිරිමේ පදනම මත බංගලාව වෙන් කරනු ලැබේ. එවැනි අවස්ථාවකදි ගෙවන ලද මුදල ආපසු ගෙවනු ලැබේ.
3. **වෙන් කරගත් සංචාරක බංගලාවක් භාවිතා කිරිමට නොහැකි විම මත ඒ වෙනුවෙන් ගෙවන ලද මුදල් ආපසු ගෙවිමක් හෝ වෙනත් දිනයක් ලබාදිම සිදුකරනු නොලැබේ.**
4. **සංචාරක නිවාසයක් වෙන් කරන දිනයක් ලෙස සලකනු ලබන්නේ එදින ප.ව.12.00 සිට පසුදින ප.ව.12.00 දක්වා වන බැවින් පසු දින ප.ව.12.00 වන විට සංචාරක නිවාසය නැවත භාර දිය යුතුය.**
5. වෙන් කරගත් අයදුම්පත්‍රය කිසිදු හේතුවක් නිසා හෝ වෙනත් අයදුම්කරුවෙකු වෙත පැවරිමට ඉඩ දෙනු නොලැබේ.
6. අයදුම්පතෙහි සඳහන් ව නොමැති පුද්ගලයින් සඳහා නවාතැන් පහසුකම් නොසපයන ලෙස සංචාරක නිවාස භාරකරුවන් දැනුවත් කර ඇති බැවින් අයදුම්පතෙහි නම සඳහන්ව නොමැති කිසිම අයෙකු සංචාරක නිවාසයේ නවාතැන් ගැනිමට රැගෙන නොයා යුතුය.
7. සංචාරක නිවාසයේ ගත කරන කාලය තුළ එහි අභ්‍යන්තර හෝ බාහිර කිසිවකට අලාභ හානි නොකළ යුතුය. එවැනි අලාභ හානියක් සිදුවුවහොත් ඊට අදාළ සියලු වියදම් ඔබ විසින් දැරිය යුතුය.
8. මෙම සංචාරක නිවාසයේ උත්සව හෝ සම්භාෂණ පැවැත්විම සම්පූර්ණයෙන් ම තහනම්ය.
9. සංචාරක නිවාසයට ඇතුල් වූ පසු ඔබට මුලුතැන් ගෙයි හා අනෙකුත් ස්ථානවල තබා ඇති භාණ්ඩවල ලැයිස්තුවක් ලබාගත හැකිය.ඒ අනුව ඔබට අවශ්‍ය කරන භාණ්ඩ භාරගෙන, ආපසු පැමිණිමේදි එම භාණ්ඩ ඒ ආකාරයෙන්ම නිවාස භාරකරු වෙත භාරදුන් බවට සහතික කර ගත යුතුය.
10. ඔබ සංචාරක නිවාසයේ ගත කරන කාලය තුළ ඔබට විරුද්ධව යම් පැමිණිල්ලක් ලැබුණහොත් එය විමර්ශනය කිරිමෙන් පසු ඒ සම්බන්ධයෙන් ඔබ වගකිව යුතු බව අනාවරණය වුවහොත් ඉදිරියේදි මෙම අමාත්‍යාංශයේ සංචාරක නිවාස වෙන් කිරිම පිළිබඳ ඔබගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.
11. ආහාර පිසීම
    I. ඔබට ආහාර ලබාගැනිමට අවශ්‍ය ද්‍රව්‍ය ලබාදුන් විට නිවාස භාරකරු විසින් ආහාර පිළියෙළ කර දෙනු ලැබේ. සංචාරක නිවාසයේ ගෑස් භාවිතා කර ආහාර පිසිම සිදුකරන්නේ නම් ගෑස් සඳහා නියමිත මුදලද ඔබ සංචාරක නිවාසයෙහි භාවිතා කරන ඇඳ ඇතිරිලි හා කොට්ට උර පිරිසිදු කිරිමට අදාල ගාස්තු (Laundry Charges) සංචාරක බංගලා භාරකරු වෙත ගෙවීම් කර ඊට අදාල ලදුපත ලබාගත යුතුවේ.
    II. සංචාරක නිවාස භාරකරු විසින් ද්‍රව්‍ය සපයා ආහාර පිළියෙල කර දෙන්නේ නම් ඒ සඳහා නියමිත මුදල සංචාරක බංගලා භාරකරු වෙත ගෙවිය යුතුය.
12. පොදු දේපළ
    I. සංචාරක නිවාස භූමියේ ඇති විසිතුරු පැල,මල් සහ පළතුරු ආදි ගස්වලට ානි නොකළ යුතු අතර විශේෂයෙන් කුඩා ළමුන්ගෙන් මෙම දේපලවලට වන හානිය වළක්වා ගැනිමට කටයුතු කළ යුතුය.
    II. ඔබ මෙම නිවසට ඇතුලු වීමෙන් පසු, නිවාසයේ ගෘහ භාණ්ඩ හා ඔබ විසින් පරිහරණය කරනු ලබනඅනිකුත් උපකරණ ආරක්ෂා කිරිම ඔබගේ යුතුකමකි.
    III. සංචාරක නිවාස පිරිශ්‍රයෙහි ඔබගේ අපරික්ෂාකාරි ක්‍රියාකලාපයන් හේතුවෙන් ඔබට සිදුවන කිසිදු අලාභයකට/හානියකට අමාත්‍යාංශය වග කියනු නොලැබේ.

**මේ සම්බන්ධව 2017.08.09 දිනැතිව නිකුත් කර ඇති අධිකරණ අමාත්‍යාංශයීය චක්‍රලේඛ 2/2017 මෙය නිකුත් කර ඇති දින සිට අවලංගු වේ.**